**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අර්ථසාධක අරමුදල 'ඒ'**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අර්ථ සාධක අරමුදල - 'ඒ' හ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සාමාජිකයන්ට ලබා ද තිබූ ණය වර්ෂය අවසානයේ ණය ක්‍රමක්ෂය කිරීමේ උපලේඛනයට අනුව දැක්වෙන ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට සාමාජිකයන්ගේ දායකත්ව උපලේඛනයට අනුව දැක්වෙන ශේෂයන්ගෙන් වෙනස් වේ.

| සේවක අංකය | අර්ථ සාධක අරමුදල් (ඒ) ලේඛනය හා 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ණය ශේෂය | 2011 දෙසැම්බර් 31 දිනට ණය ක්‍රමක්ෂය කිරීමේ උපලේඛනයට අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 96 | 1,814,979.31 | 1,813,725.01 | 1,254.30 |
| 76 | 580,000.00 | 575,000.00 | 5,000.00 |
| 101 | 1,427,166.42 | 1,413,665.31 | 13,501.11 |
| 92 | 262,878.46 | 257,766.02 | 5,112.44 |
| 88 | 657,462.96 | 648,472.90 | 8,990.06 |
| එකතුව | 4,742,487.15 | 4,708,629.24 | 33,857.91 |

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වාර්ෂිකව බැංකුව විසින් අරමුදලට කරන ලද දායකය වර්ෂ ගණනාවක එකතුව ශේෂපත්‍ර දිනයට රු.48,138,871 ක් වන බවත්, එය අරමුදලට මාරු කරනු වෙනුවට ලැබිය යුතු මුදල් ලෙස දක්වා ඇති බවත් නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කරන ලද පොළිය රු.5,922,971 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද රු.6,914,930 ක පොළිය සමග සැසඳීමේදී රු.991,959 කින් එනම්, 14.34 කින් අඩුවීමක් පෙන්නුම් කෙරුණි. මෙම ඍණ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ විශ්‍රාම යාම හා පොළී අනුපාතය අඩුවීම හේතුවෙන් සාමාජිකයන්ගේ මුළු දායකත්වය පහත වැටීමයි.

(ආ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵල පසුගිය වර්ෂ 04 තුළ අඩුවී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| | | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| (i) | ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 759,453 | 1,714,287 | 3,335,702 | 4,822,617 |
| (ii) | සාමාජිකයන්ට දෙන ලද ණය මත පොලී ආදායම | 444,107 | 389,447 | 470,074 | 567,637 |
| (iii) | ඉතිරි කිරීමේ ගිණුම මත පොලී ආදායම | 47,262 | - | - | - |
| (iv) | උපයන ලද මුළු පොලී ආදායම | 1,250,822 | 2,103,734 | 3,805,776 | 5,390,254 |
| (v) | බැංකු ගාස්තු | - | 1,500 | 100 | - |
| (vi) | බදු වියදම් | 599,455 | 701,570 | 1,033,539 | 997,905 |
| (vii) | ශුද්ධ පොලී ආදායම | 651,367 | 1,400,664 | 2,772,137 | 4,392,348 |
| (viii) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අතිරේක දායකත්වය | 5,271,604 | 5,514,266 | 7,358,120 | 5,408,362 |
| (ix) | මුළු ආදායම | 5,922,971 | 6,914,930 | 10,130,257 | 9,800,711 |
| (x) | සාමාජිකයන්ට මුළු පොලී දායක මුදල් | 5,922,971 | 6,914,930 | 10,130,257 | 9,800,711 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී ස්ථාවර තැන්පතු මත පොළී ආදායම රු.4,822,617 සිට රු.759,453 දක්වා එනම්, 84.25% කින් පහත වැටී තිබුණි. මෙම අඩුවීමේ ප්‍රවණතාවයට හේතුවී තිබුණේ ස්ථාවර තැන්පතු ආපසු ලබා ගැනීමයි.

(ආ) 2008 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී, සාමාජිකයන්ට දෙන ලද ණය මත පොළී ආදායම රු.567,637 සිට රු.444,107 දක්වා එනම්, 21.76% කින් අඩුවී තිබුණි. මෙම අඩුවීමේ ප්‍රවණතාවයට හේතුවී තිබුණේ සාමාජිකයින් ණය පියවීමයි.

(ඇ) 2010 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී අතිරේක දායකත්වය රු.5,514,266 සිට රු.5,271,604 දක්වා 4.40% කින් අඩු වී තිබුණු අතර, සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද මුළු පොළී ප්‍රමාණය රු.6,914,930 සිට රු.5,922,971 දක්වා 14.34% කින් අඩු වී තිබුණි.

## 2.2 සාමාජිකයන්ට ප්‍රදානය කරන ලද ණය

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ට දෙන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | 2011 | 2010 |
| | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 4,947,066 | 7,426,264 |
| එකතු කළා: | | |
| වර්ෂය තුළ සාමාජිකයන්ට ප්‍රදානය කරන ලද ණය | 5,540,000 | 480,000 |
| | 10,487,066 | 7,906,264 |
| අඩු කළා : | | |
| වර්ෂය තුළ අයකර ගැනීම් | 2,636,670 | 2,959,198 |
| | 7,850,396 | 4,947,066 |
| එකතු කළා: | | |
| අතිරේක මුදල් සාමාජිකයන්ට ආපසු ගෙවීම් හා ණය මත පොළී | 7,708 | - |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 7,858,104 | 4,947,066 |

2011 වර්ෂය තුළදී සාමාජිකයන්ට දෙන ලද ණය 2010 වර්ෂය සමඟ සැසඳමේදී රු.5,060,000 කින් එනම්, 1,054.16% කින් වැඩිවී තිබුණු අතර, 2011 වර්ෂයේ අයකර ගැනීම් 2010 වර්ෂය සමඟ සැසඳීමේදී රු.322,528 කින් එනම්, 10.89 කින් අඩු වී තිබුණි.

## 2.3 සාමාජිකයන්ගේ දායකත්වය

විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සාමාජික දායකත්වය, බැංකු දායකත්වය හා සාමාජික ගිණුම්වලට බැර කරන ලද පොලී පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2011 | | | | 2010 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික දායකත්වය | බැංකුවේ දායකත්වය | බැර කරන ලද පොලී | එකතුව | සාමාජික දායකත්වය | බැංකුවේ දායකත්වය | බැර කරන ලද පොලී | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 8,412,627 | 12,596,432 | 46,168,275 | 67,177,334 | 8,555,779 | 12,810,382 | 44,189,640 | 65,555,801 |
| එකතු කළා : | | | | | | | | |
| වර්ෂය තුළ දායකත්වය හා විවිධ ණයගැතියන් | 937,789 | 1,406,705 | 5,922,971 | 8,267,465 | 1,384,229 | 2,075,998 | 6,852,407 | 9,370,109 |
| එකතුව | 9,350,416 | 14,003,137 | 52,091,246 | 75,444,799 | 9,940,008 | 14,886,380 | 51,042,047 | 74,925,910 |
| අඩු කළා : | | | | | | | | |
| වර්ෂය තුළ ගෙවීම් | 1,586,402 | 2,361,501 | 10,147,747 | 14,095,650 | 1,527,381 | 2,289,948 | 4,873,773 | 7,748,576 |
| **ඉදිරියට ගෙන ගිය ශේෂය** | **7,764,014** | **11,641,636** | **41,943,499** | **61,349,149** | **8,412,627** | **12,596,432** | **46,168,274** | **67,177,334** |

2011 වර්ෂය තුළදී සාමාජිකයන්ගේ අරමුදලට දායකත්වය 2010 වර්ෂය සමඟ සැසඳීමේදී රු.446,440 කින් එනම්, 32.25% කින් අඩුවී තිබුණු අතර, බැංකු දායකත්වයද රු.669,293 කින් එනම්, 32.23% කින් සාමාජික දායකත්වය පරිදිම අඩුවී තිබුණි. 2010 වර්ෂය සමඟ සැසඳීමේදී 2011 මුළු ගෙවීම් රු.6,347,074 කින් එනම්, 81.91% කින් වැඩි වී තිබුණි.